දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍ය / அமைச்சர் / Minister } 2784832, 2784867, 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784812

Kotte කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846

ඊමේල් – மின்னஞ்சல்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ බත්තරමුල්ල
'இசுருபாய' ஸ்ரீ ஜயவர்தனபுர
பத்தரமுல்லை
"Isurupaya", Sri Jayawardhanapura
Battaramulla.

2

21 SEP 2018

මගේ අංකය / எனது இல. / My No. } ED/7/99/01/50

ඔබේ අංකය / உமது இல. / Your No. } ......................................

දිනය / திகதி / Date } 2013-04-19

# පාසල් ගොඩනැගිලි චක්‍රලේඛ අංක: 01/2013

සියළුම ජාතික පාසල් වල විදුහල්පතිවරුන් වෙත,

<u>පාසල් සංවර්ධන සමිති, ආදි ශිෂ්‍ය සංගම්, පරිත්‍යාගශීලීන් හෝ දෙමාපිය මූල්‍යාධාර සපයා ජාතික පාසල් වල කරනු ලබන ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබා ගැනීම</u>

මගේ අංක ED/7/99/3/1/සං.ප්‍ර./50 හා 2012-09-19 දිනැති චක්‍රලේඛ අංක 02/2012 අවලංගු කර මෙම චක්‍රලේඛනය නිකුත් කරමි.

පාසල් සංවර්ධන සමිතියේ, ආදි ශිෂ්‍ය සංගමයේ හෝ පරිත්‍යාගශීලීන්ගේ හෝ දෙමාපියන් විසින් ලබා දෙන මූල්‍ය ආධාර යොදා ගනිමින් ජාතික පාසලක යම් ඉදිකිරීමක් කිරීමට අදහස් කරන්නේ නම්, ඒ සඳහා පහත දැක්වෙන තොරතුරු මීට යා කර ඇති අයදුම් පත්‍රය සමග (ඇමුණුම 1) සම්පූර්ණ කර ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසු පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

මෙම අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් කරුණු ගැන විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

1. <u>යෝජිත ව්‍යාපෘතියේ සැලසුම් හා ඇස්තමේන්තුව</u>

යෝජිත ව්‍යාපෘතියේ

අ. වාස්තු විද්‍යාත්මක සැලසුම්,
ආ. ව්‍යුහාත්මක ඉංජිනේරු සැලසුම්,
ඇ. ඇස්තමේන්තුව සහ,
ඈ. ඉදිකිරීම් කිරීමට යෝජිත ස්ථානය පාසල් පිරිවිතරයෙහි ඇතුළත් කර සකස් කළ සැලසුම ඉදිරිපත් කළ යුතුය.

එනම් වාස්තු විද්‍යාඥ සැලසුම් වලට වාස්තු විද්‍යාඥයකු විසින්ද, ව්‍යුහාත්මක ඉංජිනේරු සැලසුම් සහ ඇස්තමේන්තුව වලට ඉංජිනේරුවරයකු විසින් ද සහතික කළ යුතු අතර, එම සහතික කරන වෘත්තිකයාගේ නිල මුද්‍රාව යොදා අත්සන් තැබිය යුතුය.

2. <u>ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුදල</u>

යෝජිත සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුළු පිරිවැය පාසල සතුව ඇති බව සනාථ කිරීමට තොරතුරු ඉදිරිපත් කළ යුතුය. මේ සඳහා ව්‍යාපෘතියට වෙන් කළ මුදල දැක්වෙන බැංකු වාර්තා, ජංගම ගිණුම් ප්‍රකාශන ආදියේ/ජාවර්ර නැත්පත් සහතික ආදියේ විදුහල්පති විසින් සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

3. <u>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවන ආකාරය</u>

3.1 පාසල මගින්ම ප්‍රසම්පාදන ක්‍රියාවලිය කරන්නේ නම්, ඒ සඳහා පාසලට ඇති හැකියාව තහවුරු කළ යුතුය.

3.2 එසේ නොමැතිනම්, අමාත්‍යාංශයේ හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ප්‍රසම්පාදනය සඳහා භාර දී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදහස් කරන්නේද යන බව.

3.3 වැඩිය පාසල මගින් ක්‍රියාත්මක කරන්නේ නම් (3.1 පරිදි) ඉදිකිරීම් අධීක්ෂණය පහත දැක්වෙන පරිදි කමිටු 02 ක් නම් කර එයටද අනුමැතිය ලබා ගත යුතුයි.

3.3.1 තාක්ෂණ කමිටුව (අධීක්ෂණ ඉංජිනේරු ඇතුළුව)
මෙම කමිටුවේ වරලත් ඉංජිනේරුවරයකු, වරලත් වාස්තු විද්‍යාඥයකු, තාක්ෂණ නිලධාරියකු හෝ ප්‍රමාණ සමීක්ෂකයකු අවම වශයෙන් ඇතුළත් විය යුතුය.

3.3.2 මෙහෙයුම් කමිටුව
අවම සාමාජිකයින් සංඛ්‍යාව 3 කි. මෙයට ආදි ශිෂ්‍ය, පාසල් සංවර්ධන සමිති සාමාජික දෙමව්පියන් ඇතුළත් විය යුතු අතර, පිළිගත් වෘත්තිකයින් දෙදෙනෙකු හෝ ඇතුළත් විය යුතු වේ.

4. <u>වෙනත් කරුණු</u>
රජයේ මුදල් යෙදවීමකින් තොරව ඉහත පරිදි මුදල් යෙදවීමෙන් පාසලේ දැනට අර්ධ අවසන් ගොඩනැගිල්ලක් ඇත්නම් එහි වැඩ නිම නොකර නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අවසර ලබාදිය නොහැකි බැවින්, එලෙස ඉදිකළ අඩක් නිමකළ ගොඩනැගිලි දැනට පාසලේ නොමැති බවට සහතිකයක් ද විදුහල්පති විසින් ලබා දිය යුතුය.

අසම්පූර්ණ අයදුම් පත්‍ර මගින් කරන ඉල්ලීම් අනුමැතිය ලබාදීම සඳහා සලකා නොබලන බවද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

එස්.එම්. ගොත්ඨාභය ජයරත්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

<u>පිටපත්:</u>

1. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) දකුණු පළාත/බස්නාහිර පළාත / සබරගමුව පළාත
2. අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) - වයඹ පළාත

} කරුණාකර ඉහත ක්‍රියාවලිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් ඉංජිනේරු / ප්‍රාදේශීය ඉංජිනේරු දැනුවත් කර අ.ක.ස.

3. පාසල් ගොඩනැගිලි අධ්‍යක්ෂ - උතුරු පළාත / නැගෙනහිර පළාත — කරුණාකර දැ.ගැ.පි. සහ අ.ක.ස.

4. සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු - — කරුණාකර මේ අනුව ඔබ පළාතේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ද දැනුවත් කිරීම සඳහා

5. නියෝජ්‍ය අධ්‍යක්ෂ (පා.ගො.) - මධ්‍යම පළාත
6. ඉංජිනේරු (පා.ගො.) - උතුරු මැද පළාත
ඌව පළාත

} කරුණාකර දැ.ගැ.පි. සහ අ.ක.ස.

**.......................................... පාසලේ පාසල් සංවර්ධන සමිතිය, ආදි ශිෂ්‍ය සංගමය, පරිත්‍යාගශීලීන්ගෙන් හෝ දෙමාපිය මූල්‍යාධාර සපයා ඉදිකිරීම සඳහා අපේක්ෂිත .......................................... ට අනුමැතිය ලබා ගැනීම**

මෙම වාර්තාවේ I කොටස විදුහල්පති විසින් ද, II කොටස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද, III කොටස අදාළ පරිදි ප්‍රදේශයේ පාසල් ගොඩනැගිලි ඉංජිනේරු හෝ දිස්ත්‍රික් ඉංජිනේරු (පාසල් ගොඩනැගිලි) හෝ ප්‍රාදේශීය ඉංජිනේරු විසින් ද, IV කොටස පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද සම්පූර්ණ කර අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් ගොඩනැගිලි අධ්‍යක්ෂ මඟින් අධ්‍යාපන ලේකම් වෙත යොමු කළ යුතුයි.

## I කොටස: විදුහල්පතිගේ වාර්තාව

1. පාසල සහ එහි පිහිටීම :

1.1 පාසලේ නම

..........................................................................................

1.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

..........................................................................................

1.3 මෙම වසරේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව

..........................................................................................

2. යෝජිත ඉදිකිරීම ගැන තොරතුරු :

2.1 ගොඩනැගිල්ලක් නම් ; දිග ..........................................................
පළල ..........................................................
තට්ටු ගණන ..........................................................

2.2 එම ගොඩනැගිල්ලේ වර්ගය

..........................................................................................

(එනම් පන්ති කාමර ගොඩනැගිල්ලක් විද්‍යාගාරයක් ආදී වශයෙන්)

2.3 වෙනත් ඉදිකිරීමක් නම් එම ඉදිකිරීම ගැන කෙටියෙන් විස්තර කරන්න.

..........................................................................................

..........................................................................................

2.4 පහත දැක්වෙන සැලසුම් ඇස්තමේන්තු පිටපත් 02 ක් මීට යා කර ඇත.

2.4.1 වාස්තු විද්‍යාත්මක සැලසුම් (වරලත් වාස්තු විද්‍යාඥයෙකු අනුමත කර නිල මුද්‍රා තබා තිබිය යුතුයි)

2.4.2 විදුලි/යාන්ත්‍රික ඉංජිනේරු සැලසුම් (වරලත් ඉංජිනේරුවකු අනුමත කර තිබිය යුතුයි)

2.4.3 ඉංජිනේරු ඇස්තමේන්තු (වරලත් ඉංජිනේරුවකු අනුමත කර තිබිය යුතුයි)

2.4.4 ඉදිකිරීම කිරීමට යෝජිත ස්ථානය හෝ පරිවිතරයෙහි ඇතුළත් කර සකස් කළ සැලසුම

2.5 යෝජිත ඉදිකිරීමට වැය වන මුදල සපයන ආකාරය

2.5.1 පාසල් සංවර්ධන සමිතිය රු. ..............................

2.5.2 ආදි ශිෂ්‍ය සංගමය රු. ..............................

2.5.3 පරිත්‍යාගශීලීන් රු. ..............................

2.5.4 දෙමව්පිය මූලාධාර රු. ..............................

2.5.5 වෙනත් රු. ..............................

මුළු මුදල රු. ..............................

ඉහත මුදල් දැනටමත් පාසල සතුව ඇති බව සනාථ කිරීමට බැංකු වාර්තා, ස්ථාවර තැන්පත් ආදියේ පිටපත් සහතික කර මෙම ආකෘති පත්‍රයට අමුණා ඇත. මෙම මුදල මෙම ව්‍යාපෘතිය හැරුණු විට වෙනත් කාර්යයන් සඳහා යොදා නොගන්නා බවට ද සහතික කරමි.

3. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආකාරය

3.1. පාසල මගින්ම ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉටුකරනු ලබන්නේ නම් පහත සඳහන් කාර්යයන් ඉටු කිරීමට හැකියාව ඇති බවට සහතිකයක් විදුහල්පති විසින් ලබා දිය යුතුය.

3.1.1 ලංසු ලියවිලි පිළියෙල කිරීම

3.1.2 ලංසු කැඳවීම

3.1.3 තාක්ෂණ කමිටුවක් මගින් ලංසු ඇගයීම

3.1.4 ප්‍රසම්පාදන කමිටු තීරණය ලබා ගැනීම

3.1.5 කොන්ත්‍රාත් පැවරීම

3.1.6 වැඩ අධීක්ෂණය සහ කොන්ත්‍රාත්කරුට ගෙවීම කිරීම

3.2 ඉදිකිරීම අධීක්ෂණය සඳහා පහත දැක්වෙන පරිදි කමිටු දෙකක් ද නම් කර මේ සමඟ අනුමැතියට ඉදිරිපත් කරමි.

3.2.1 තාක්ෂණ කමිටුව (අධීක්ෂණ ඉංජිනේරු ඇතුළුව) තාක්ෂණ කමිටුවේ වරලත් ඉංජිනේරුවරයකු, වරලත් වාස්තු විද්‍යාඥයකු, තාක්ෂණ නිලධාරියකු හෝ ප්‍රමාණ සමීක්ෂකයකු අවම වශයෙන් ඇතුළත් විය යුතුය

3.2.2 මෙහෙයුම් කමිටුව
අවම සාමාජිකයින් සංඛ්‍යාව 3 කි. මෙයට ආදි ශිෂ්‍ය, පාසල් සංවර්ධන සමිති සාමාජික දෙමව්පියන් ඇතුළත් විය යුතු අතර, පිළිගත් වෘත්තිකයින් දෙදෙනෙකු හෝ ඇතුළත් විය යුතු වේ.

3.2.3 තවද පිහිනුම් තටාක වැනි විශාල ව්‍යාපෘති සඳහා අවම වශයෙන් සාමාජිකයින් 09 දෙනෙකු විය යුතු අතර ඉහත 3.2.2 සංයුතිය ද මෙයට අනුගමනය කළ යුතු වේ.

3.3 ව්‍යාපෘතිය අධ්‍යාපන අමාත්‍යාංශය හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය මගින් ප්‍රතිපාදනය කරවා ඉටු කරවා ගැනීමට බලාපොරොත්තු වන්නේ ද යන බව ;

3.3.1 එසේ නම් ව්‍යාපෘතියේ මුළු පිරිවැය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලයේ තැන්පත් කළ යුතුය.

3.3.2 මෙහිදී ඉදිකිරීම් අධීක්ෂණය කරනු ලබන ප්‍රාදේශීය ඉංජිනේරු / දිස්ත්‍රික් ඉංජිනේරුට සහාය වීම සඳහා ඉහත 3.2 හි සඳහන් කමිටු දෙකක් ද නම් කර අනුමැතියට මේ සමග ඉදිරිපත් කරමි.

4. දැනට පාසලේ වැඩ අවසන් නොකළ ගොඩනැගිලි හෝ වෙනත් ඉදිකිරීම් (අර්ධ අවසන්) පවතීද යන්න සහ ඒවා නිම නොකිරීමට හේතුව

..............................................................................................................

යෝජිත ඉදිකිරීම මෙම පාසලට ඉතාමත් අත්‍යාවශ්‍ය ඉදිකිරීමක් බවත්, ඉහත 1 සිට 4 දක්වා සියළු තොරතුරු නිවැරදිව මේ සමග ඉදිරිපත් කර ඇති බවත් සහතික කරමි.

..............................
දිනය

..............................
විදුහල්පතිගේ අත්සන
(නිල මුද්‍රාව)

## II කොටස: කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය

විදුහල්පති විසින් ඉහත යෝජනා කර ඇති ඉදිකිරීම, මෙම පාසලට අත්‍යාවශ්‍ය ඉදිකිරීමක් බවත් විදුහල්පති විසින් යෝජනා කර ඇති ආකාරයට මෙම ඉදිකිරීම ඉටුකරවීම සුදුසු බවට නිර්දේශ කරමි / නොකරමි.

නිර්දේශ නොකරන්නේ නම් ඊට හේතු :

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................

..............................
දිනය

..............................
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ අත්සන
(නිල මුද්‍රාව)

## III කොටස: ප්‍රදේශයේ පාසල් ගොඩනැගිලි ඉංජිනේරු හෝ දිස්ත්‍රික් ඉංජිනේරු හෝ ප්‍රාදේශීය ඉංජිනේරුගේ නිර්දේශය

විදුහල්පති සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් තොරතුරු මා විසින් පරීක්ෂා කර බැලුවෙමි. මෙම යෝජිත ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු / අධීක්ෂණ කටයුතු ඉටු කර දීමට එකඟ වෙමි.

එසේ එකඟවිය නොහැකි නම් ඊට හේතු

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

....................................                      ..............................................

දිනය                      පාසල් ගොඩනැගිලි ඉංජිනේරු/<br>දිස්ත්‍රික් ඉංජිනේරු / ප්‍රාදේශීය ඉංජිනේරු<br>(නිල මුද්‍රාව)

## IV කොටස: පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය

පාසල් ගොඩනැගිලි අධ්‍යක්ෂ මගින්

ලේකම්,

අධ්‍යාපන අමාත්‍යාංශය

යෝජිත නව ඉදිකිරීම නිර්දේශ කරමි / නොකරමි. ඉහත 3.3. ඉල්ලීම අනුව මෙම ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු ඉටු කර දීමට ද එකඟ වෙමි.

නිර්දේශ නොකරන්නේ නම් එයට හේතු

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

....................................                      ..............................................

දිනය                      පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ<br>(නිල මුද්‍රාව)

## V කොටස: පාසල් ගොඩනැගිලි අධ්‍යක්ෂගේ නිර්දේශය

ලේකම්,

අධ්‍යාපන අමාත්‍යාංශය

ව්‍යාපෘතියට අදාළ සියළු තොරතුරු නිවැරදිව ඉදිරිපත් කර ඇත / නැත. ව්‍යාපෘතිය නිර්දේශ කරමි / නොකරමි.

නිර්දේශ නොකරන්නේ නම් එයට හේතු

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.................................... ....................................

දිනය පාසල් ගොඩනැගිලි අධ්‍යක්ෂ

(නිල මුද්‍රාව)

## VI කොටස: අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය

පාසල් ගොඩනැගිලි අධ්‍යක්ෂ මඟින්

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,

........................................ පළාත

යෝජිත ව්‍යාපෘතිය අනුමත කරමි / නොකරමි.

.................................... ....................................

දිනය ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

(නිල මුද්‍රාව)